**සති පාසල - සබරගමුව පළාත**

**නිවිතිගල අධ්‍යාපන කලාපය**

**භූගෝල විද්‍යාව - 9 ශ්‍රේණිය - 2021 අප්‍රේල් - හතරවන සතිය**

# ආසියානු ප්‍රදේශය

## පැවරුම 4

1. ආසියාවේ ප්‍රමුඛතම කෘෂිකාර්මික රටක් ලෙස පාකිස්ථානයේ සිදුවන කෘෂි නිෂ්පාදන පහක් සඳහන් කරන්න.

2. පාකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික වගා කන්න දෙක සහ ඒවා බලපැවැත්වෙන කාලසීමාවන් මොනවාද?

3. කාර්මික රටක් ලෙස ජපානය තුළ සිදුවන ප්‍රධානතම නිෂ්පාදන කර්මාන්ත වලට උදාහරණ හතරක් ලියා දක්වන්න.

4. ජපානය තුළ නිපදවන මෝටර් රථවල පවතින උසස් ලක්ෂණ මොනවාද?

5. ජපානයේ නිෂ්පාදන සඳහා ප්‍රසිද්ධ සමාගම් පහ බැගින් පහත පරිදි වගුගත කරන්න.

| මෝටර් රථ | ඉලෙක්ට්‍රොනික් හා විදුලි උපකරණ | පරිගණක හා උපාංග |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

6. පාකිස්ථානයේ කෘෂි අංශයේ නියුතු ශ්‍රමිකයන්ගේ ප්‍රතිශතයද, ජපානයේ කාර්මික අංශයේ රැකියාවල නියුතු ශ්‍රමික පිරිස සහ ඩුබායි රාජ්‍යයේ සේවා අංශයේ රැකියාවල වල නියුක්ත පිරිසේ ප්‍රතිශතයද වෙන වෙනම ලියා දක්වන්න.

7. ගුවන් මධ්‍යස්ථානයක් සහ වරාය මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි වැදගත්වීමට හේතු දෙකක් සඳහන් කරන්න.

8. ඩුබායි පිහිටි ස්ථානය ලෝක සිතියමක් ආශ්‍රයෙන් හඳුනාගෙන එය කෘෂිකාර්මික රටක් නොවී සේවා ආර්ථිකයක් හිමි රටක් ලෙස දියුණු වූයේ කුමන කරුණ නිසාදැයි දක්වන්න.

9. සේවා මධ්‍යස්ථානයක් ලෙස ඩුබායි වැදගත්වන අනෙකුත් ක්ෂේත්‍ර තුනක් සඳහන් කරන්න.

10. ආසියානු කලාපයේ කෘෂිකාර්මික, කාර්මික සහ සේවා ආර්ථිකයන් සඳහා ප්‍රමුඛ වෙනත් රටවල් මොනවාදැයි ඔබගේ ගුරුතුමා හෝ ගුරුතුමියගෙන් විමසා දැනගන්න.

*සැකසුම - ඉසුරු බණ්ඩාර, නිවිතිගල අධ්‍යපන කලාපය, දොළොස්වලකන්ද විද්‍යාලය*